# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

**53 A, ඩී.එස්.ෆොන්සේකා පාර, කොළඹ - 05, ශ්‍රී ලංකා**

දුරකථන / ෆැක්ස් : 2556629 ඊ-මේල් : slpia@sltnet.lk / slpiaexco@gmail.com වෙබ් අඩවිය : www.slpia.lk


මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/141/20 ඔබේ අංකය :

සී.ඩී. වික්‍රමරත්න මහතා, 2020.08.20

වැඩබලන පොලිස්පති,

පොලිස් මූලස්ථානය,

කොළඹ 01.

<u>කොට්ඨාශ සම්බන්ධීකරණ ලේකම්වරුන්ගේ පළමු රැස්වීම සම්බන්ධව.</u>

2019.03.23 වන දින පවත්වන ලද පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ 68 වැනි වාර්ෂික මහසභා රැස්වීමේදී සම්මත කරගන්නා ලද යෝජනාවක් අනුව සහ 2020.05.16 වන දින ආර්.ටී.එම් 877 හා සී.ආර්.ටී.එම් 958 පණිවුඩය පරිදි සියළුම ප්‍රාදේශීය හා ක්‍රියාකාරී කොට්ඨාශ නියෝජනය වන අයුරින් පහත සඳහන් කොට්ඨාශ සම්බන්ධීකරණ ලේකම්වරුන් පත්කර ගෙන ඇත. (නිලධාරීන්ගේ නාමලේඛණය අමුණා ඇත.)

මෙම කොට්ඨාශ සම්බන්ධීකරණ ලේකම්වරුන් හදුනාගැනීම හා ඔවුන්ගේ ඉදිරි කාර්යභාරය ඇතුළු සම්බන්ධීකරණ කටයුතු සිදුකරන ආකාරය සම්බන්ධයෙන් සියළුම කොට්ඨාශ සම්බන්ධීකරණ ලේකම්වරුන් දැනුවත් කිරීමට පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව විසින් අදහස් කර ඇත.

ඒ අනුව 2020.08.28 වන දින පැය 10.00 ට කොළඹ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ දේශන ශාලාවේදී පැවැත්වෙන සාකච්ඡාව සඳහා අභිනවයෙන් පත්කරගන්නා ලද පහත සඳහන් කොට්ඨාශ සම්බන්ධීකරණ ලේකම්වරුන් සහභාගි කරවා ගැනීම සඳහා දැනුවත් කිරීමේ පණිවුඩය මේ සමග ඔබතුමා වෙත ඉදිරිපත් කරන අතර, එම පණිවුඩය සියළුම ප්‍රාදේශීය හා ක්‍රියාකාරී කොට්ඨාශයන් වෙත බැහැර කිරීමට අවසර ලබා දෙන මෙන් ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ශ්‍රී ලංකා පොලිස්පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

ප්‍රගීත් ප්‍රේමසිරි,
නීතීඥ, නීතිවේදී (ගෞරව),
පොලිස් පරීක්ෂක,
ලේකම්,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

**නීතීඥ ප්‍රගීත් ප්‍රේමසිරි**
**නීතිවේදී (ගෞරව)**
**ගරු ලේකම්,**
**ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය**

# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

53 A, ඩී.එස්.ෆොන්සේකා පාර, කොළඹ - 05, ශ්‍රී ලංකා

දුරකථන / ෆැක්ස් : 2556629 ඊ-මේල් : slpia@sltnet.lk / slpiaexco@gmail.com වෙබ් අඩවිය : www.slpia.lk


මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/140/20 ඔබේ අංකය :

2020.08.20

ලේකම්, සියළුම - කොට්ඨාශභාර නිලධාරීතුමන්
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය ගෙන්, (ප්‍රාදේශීය හා ක්‍රියාකාරී)

**පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය වෙත පත්කරගන්නා ලද කොට්ඨාශ සම්බන්ධීකරණ ලේකම්වරුන්ගේ රැස්වීම.**

2019.03.23 වන දින පවත්වන ලද පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ 68 වැනි වාර්ෂික මහසභා රැස්වීමේදී සම්මත කරගන්නා ලද යෝජනාවක් අනුව 2020.05.16 වන දින ආර්.ටී.එම් 877 හා සී.ආර්.ටී.එම් 958 දරන පණිවුඩය පරිදි සියළුම ප්‍රාදේශීය හා ක්‍රියාකාරී කොට්ඨාශ නියෝජනය වන අයුරින් පහත සඳහන් කොට්ඨාශ සම්බන්ධීකරණ ලේකම්වරුන් පත්කර ගෙන ඇත.

මෙම කොට්ඨාශ සම්බන්ධීකරණ ලේකම්වරුන්ගේ පළමු රැස්වීම 2020.08.28 වන දින පැය 10.00 ට කොළඹ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ පිහිටි රැස්වීම් ශාලාවේදී පැවැත්වීමට නියමිතව ඇත.

ඒ සඳහා සහභාගිවීමට ඔබතුමාගේ කොට්ඨාශය නියෝජනය කරන පහත සඳහන් කොට්ඨාශ සම්බන්ධීකරණ නිලධරයන් රාජකාරියෙන් මුදා හරිනමෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ශ්‍රී ලංකා පොලිස්පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

ලේකම්,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.
ගරු ලේකම්
පොලිස් පරීක්ෂක සංගමය

අධ්‍යක්ෂ / පොලිස්පති අණදෙන තොරතුරු කොට්ඨාශය

ඉහත පණිවුඩය නොපමාව බැහැර කිරීමට කටයුතු කරන්න.

පුද්ගලික සහකාර,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,
පරිපාලන.